**දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.**

**අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැගෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.**

**තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.**

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න



# තමිළිනීගේ කතාව

## 14

# තෙවසරකට පසු සතියක නිවාඩුවක් ගෙදර ගියෙමි

විශාල කඳුළු කතාවන් සංඛ්‍යාවක් සමඟ පුනගරී යුද්ධය කොටි සංවිධානයට මහත් විශාල ජයග්‍රහණයක් ලබාදී තිබුණි. අධිවේග මුහුදු යාත්‍රා අත්පත් කරගැනීමත්, බර අවි විශාල ප්‍රමාණයක් අත්පත් කරගැනීමත් මහත් ජයග්‍රහණයක් ලෙස කොටින් විසින් සළකන ලදි.
ලංකාවේ හමුදාවේ පාර්ශ්වයෙන් සිදුවූ ජීවිත හානි සංඛ්‍යාව විශාල විය. එහිදී මා දුටු තවත් එක් දර්ශනයක් මගේ චිත්තාභ්‍යන්තරයෙහි තැන්පත්ව ඇත්තේ සිතුවමක් සේය.

හමුදාවේ සහ කොටින්ගේ ප්‍රාණය නිරුද්ධ සිරුරු වැසි ජලයෙන් තෙත් බරිතව තැනින් තැන ගල් ගැසී තිබුණි. රත් පැහැ රුහිරු වැසි ජලය සමඟ එක්ව ගලා යමින් තිබුණි. සුළු වේලාවකට පෙර සතුරු හැඟීමෙන් යුතුව පිල් බෙදී සටන් කළ අය මහ පොළොවේ මළ සිරුරු බවට පත්ව වැටී විසිරී තිබුණු දර්ශනය මවකගේ ඇකයේ නිදාගෙන සිටින ළදරුවන්ව සිහිපත් කරන්නට සමත් විය. සියලුම වෙනස්කම්, ගැටුම්, එදිරිවාදිකම් අර්ථශූන්‍ය වී යන තැන යුද බිමයි යන්න මුළුමනින්ම අවබෝධ කරගැනීමට අවශ්‍ය බුද්ධිය ඇත්තෙන්ම ඒ වන විට මා තුළ තිබුණේ නැත.

දේශපාලන අංශයේ වගකීම දැරූ චමිල් සෙල්වන්, සෙන්පති සොර්ණම් ඇතුළු දහසකට වැඩි සටන්කරුවන් පිරිසක් මෙම සටනේදී තුවාල ලැබූහ. දින තුනකට පසු අපේ කණ්ඩායම් පුනගරීයේ සිට නැවත කැඳවා ගැනුණි. මෙම මෙහෙයුමට සම්බන්ධ වූ සෑම සටන්කාමීයෙකුටම සතියක නිවාඩුවක් හිමිවිය. සංවිධානයට බැඳුණු පසුව මම පළමු වතාවට නිවසට ගියෙමි.

ගතවූ වසර තුනක කාලය තුළදී පවුලේ සෑහෙන වෙනස්කම් සිදුවී තිබුණත්, මගේ පවුලේ අය මා වැළඳගෙන ස්නේහයෙන් මාව සතුටු කළහ. නිවාඩුව අවසන්ව නැවතත් කඳවුරට යන අවස්ථාවේ කිසිවෙක් මා සමඟ කතා නොකොට කඳුළු සහිත මුහුණින් ඉවතට ගියහ. ඥාතීන්ගෙන් වෙන්වයාම ශෝකයක් වුවත්, ප්‍රාණය පිදූ මිතුරියන්ගේ ස්මරණයන් මා නැවතත් අරගල මාවතට රැගෙන ඒමට සමත් විය.

මාත්තයා විසින් කොක්කුවිල් ප්‍රදේශයේ ස්ථාපිත කරන ලද මහජන පෙරමුණට අයත් 'ලිංගම්' කඳවුර දේශපාලන අංශය භාරකරු වූ තමිල් චෙල්වන්ගේ දේශපාලන මධ්‍යස්ථානය බවට පත් කර තිබුණි. එම පරිශ්‍රය තුළම දේශපාලන විදුහලත් පිහිටුවා තිබුණි. එහි සටන්කාමී සහෝදරියන්ට සහ සහෝදරයන්ට තනි තනි නිවෙස් විය. යාපනය විශ්වවිද්‍යාලය පිහිටා තිබුණේ ඒ කිට්ටුවයි. එහෙයින් විශ්වවිද්‍යාලයෙහි කෛලාසපති ශ්‍රවණාගාරයේ පැවැත්වෙන වැදගත් අධ්‍යාපනික වැඩසටහන්වලට සහභාගි වීමේ අවස්ථාව අපට ලැබිණ. 1993 වසරේ මැද හරියේදී එහි පැවැත්වෙන පුවත්පත් කලා වැඩ මුළුවට සහභාගි වී ජනමාධ්‍ය විෂය පිළිබඳව මහත් වැදගත් කරුණු රාශියක් ඉගෙන ගත්තෙමි.

සංවිධානයේ ප්‍රමුඛයන් විසින් ද, සංවිධානය විසින් ද ආරාධනා කරනු ලැබූ මහාචාර්යවරුන් විසින් අලුත් කරුණු රාශියක් අධ්‍යාපන කණ්ඩායමට අයත් සටන්කාමීන්ට උගන්වන ලදි. විමුක්ති කොටි සංවිධානයේ ඉතිහාසය, ලෝකයේ විමුක්ති අරගලවල ඉතිහාසය, සමාජ විද්‍යාව, සාමාන්‍ය දැනීම වැනි බොහෝ කරුණු එම ක්ෂේත්‍රවලට අයත් ගුරුවරුන් විසින් උගන්වනු ලැබුවත්, ඒ කිසිවක් අකණ්ඩව සිදුවූයේ නැත. සංවිධානයේ ප්‍රචාරක කටයුතුවලට අධ්‍යාපන කණ්ඩායමට අයත් සටන්කාමීන්ව විශේෂ කණ්ඩායම් ලෙසත් සහභාගි කරවා ගන්නා නිසා නිතර නිතර පන්ති මග හැරුණි.

**සංවිධානයෙහි නියෝජ්‍ය නායක තනතුරෙහි සිටි මාත්තයා ඉන්දීය රහස් ඔත්තු සේවය වන 'රෝ' සංවිධානයේ ඒජන්තයෙකු බවට පත්වී සංවිධානයේ නායකයාට විරුද්ධව කටයුතු කළ බවත්, මෙම පිරිස් එම කටයුතුවලට සහයෝගය දී ඇති බවත් චෝදනා පත්‍රයෙන් ප්‍රකාශ විය.**

1994 වසරේ දී කොටි සංවිධානය යාපනය දිස්ත්‍රික්කයේ වඩාත් පුළුල් ලෙසින් ප්‍රචාරක කටයුතු සිදුකරමින් තිබිණ. පුනගරී ප්‍රහාරයෙහි ජයග්‍රහණය ජනතාව තුළ කොටි පිළිබඳව මහත් බලාපොරොත්තු ඇති කළේය. එමෙන්ම මාත්තයා සමඟ එක්ව කුමන්ත්‍රණය කළ චෝදනාව යටතේ දක්ෂතා පූර්ණ ජ්‍යෙෂ්ඨ සටන්කාමීහු බොහෝ දෙනෙක් අත්අඩංගුවට පත්ව උන්හ. දේශපාලන අංශයේ ද බොහෝ දුරට වගකීම් වෙනස් කිරීම් සිදුවිය.
මෙවන් තත්ත්වයක් තුළ ඉරුපාලෛහි පිහිටි දේශපාලන පාසලේ සංවිධානයේ මධ්‍යම සහ ජ්‍යෙෂ්ඨ වගකීම් භාර සාමාජික සාමාජිකාවන් සහ සෙන්පතිවරුන් සඳහා සංවිධානයෙහි බුද්ධි අංශය රැස්වීම් සංවිධානය කර තිබුණි. අධ්‍යාපන කණ්ඩායමේ සටන්කාමීන්වන අපි ද එම රැස්වීමට සහභාගි වූයෙමු. දෑත්වල බැඳි යදම් සහිතව කීපදෙනෙක් වේදිකාවේ පේලියට අසුන් ගෙන උන්හ. ඔවුන්ගේ එක් අයෙකු හැර අනෙක් කිසිවෙකු මම දැන නොසිටියෙමි.

මම පාසලේ ඉහළ පන්තියක අධ්‍යාපනය ලැබූ කාලයෙහි සරමක් ඇඳගෙන අපේ ගමේ පා පැදියෙන් ගමන් කළ සුසීලන් අය්යා නමින් හැඳින් වූ සටන්කාමියාව පමණක් මම දැනගෙන සිටියෙමි. ඔහු උස, සුදු අයෙකි. කොටින් පුනගරී මෙහෙයුමේදී අත්පත් කරගත් හමුදාවේ යුද්ධ ටැංකිය කිසිම අත්දැකීමක් නොමැතිව පවා මහත් දක්ෂ ලෙසින් හසුරුවාගෙන පදවාගෙන පැමිණියේ ඔහු යැයි සටන්කාමී සහෝදර සහෝදරියන් කතා වෙනු මම අසා ඇත්තෙමි. මහත් දක්ෂ සටන්කාමියෙකු ලෙස ඔහුව බොහෝ දෙනා දැනගෙන උන්නේය. ඔහු එවන් වරදක් කරන්නට ඇතැයි මට විශ්වාස කළ නොහැකි විය. එම රැස්වීමේදී බුද්ධි අංශයට අයත් වගකීම් භාර සහෝදරයෙක් අදාළ පුද්ගලයන් පිළිබඳ චෝදනා පත්‍රය කියවූයේය.



සංවිධානයෙහි නියෝජ්‍ය නායක තනතුරෙහි සිටි මාත්තයා ඉන්දීය රහස් ඔත්තු සේවය වන

36 වන පිටට

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com